සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති වරණ අතරින් දී ඇති නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

01. ඔබදියා ග්‍රන්ථය අයත්වන පොත් කාණ්ඩය වන්නේ,
    (1) ඉතිහාස ග්‍රන්ථ  (2) දිවැසිවර ග්‍රන්ථ
    (3) ප්‍රඥා සාහිත්‍ය ග්‍රන්ථ  (4) එළිදරව්වාදී ග්‍රන්ථ

02. දේව වේදීය ඉතිහාස කතා ලෙස පුරාණ ගිවිසුම තුළ දක්නට ලැබෙන්නේ,
    (1) පංච පුස්තකය ය.  (2) දිවැසිවර ග්‍රන්ථ ය.
    (3) ඓතිහාසික ග්‍රන්ථ ය.  (4) ප්‍රඥා සාහිත්‍ය ග්‍රන්ථ ය.

03. කතෝලික සභාවේ අනන්‍යතාවයකි,
    (1) ඊශ්‍රායෙල් ජනතාවගේ අත්දැකීම.
    (2) පරම්පරාවෙන් දායාද වන වාචික සම්ප්‍රදාය.
    (3) දේව වේදීය කෝණයකින් නිර්මාණය වීම.
    (4) අපෝස්තුළුවරුන්ගේ සිට පැවත එන සම්ප්‍රදාය.

04. නව ගිවිසුමේ පොත් වර්ගීකරණය අනුව අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත,
    (1) සුබාරංචිය කි.  (2) සාහිත්‍ය ග්‍රන්ථයකි.
    (3) සාමාන්‍ය හසුනකි.  (4) වෙනත් සංදේශයකි.

05. බැතිමත් කිතුනුවෙකු වූ පිලමොන්ට ලියන ලද ලිපිය අයත් වන්නේ,
    (1) ද්විතීය පාවුලු සංදේශවලටය.
    (2) වෙනත් සංදේශවලටය.
    (3) ආරූඪ කර්තෘ හසුන්වලටය.
    (4) පාවුලුතුමා විසින් ම ලියන ලද හසුන්වලටය.

06. නව ගිවිසුමේ සාමාන්‍ය හසුන් වැඩි සංඛ්‍යාවක් රචනා කර ඇති අපෝස්තුළුවරයා වූයේ,
    (1) ජොහාන්තුමා ය.  (2) පේදුරුතුමා ය.  (3) ජාකෝබ්තුමාය.  (4) ජූද්තුමාය.

07. එළිදරව් සාහිත්‍යය ආරූඪ නාමයකින් ඉදිරිපත් කිරීමට හේතුව වන්නේ,
    (1) ග්‍රන්ථයේ පණිවිඩය පාඨකයා වෙත දායාද කිරීමය.
    (2) කතුවරයාගේ ආරක්ෂාව සැලසීමය.
    (3) පීඩනය දරුණු වීමය.
    (4) විරුද්ධවාදීන්ගේ අවධානය මහහරවා ගැනීම ය.

08. යුගාන්තවාදය මඟින් කිතුණු අපට ආරාධනා කරන්නේ,
    (1) යහපත් හා අයහපත් බලවේග අතර ගැටුම අවබෝධකර ගැනීමටය.
    (2) අනතුරු කල්තියා හඳුනා ගැනීමටත් ඒවායින් ආරක්ෂා වීමටත් ය.
    (3) අපට හමුවන බාධක ගැටලුවලට ඉවසීමෙන් මුහුණ දී ස්වර්ගීය සැපත ලබා ගැනීමට ය.
    (4) සතුරාගේ බලය හඳුනාගෙන ඔහුට හිස නැමීමට ය.

09. එළිදරව් සාහිත්‍යය තුළ පරිපූර්ණත්වය සංකේතවත් කරන සංඛ්‍යාව,
(1) 4 ය. (2) 7 ය. (3) 10 ය. (4) 12 ය.

10. සලමොන් රජතුමා ගිබියොන්හි දී දෙවියන්ට යාග පූජා ඔප්පු කළ බව සඳහන් ග්‍රන්ථය,
(1) 1 සාමුවෙල් ය. (2) 1 රාජාවලිය ය. (3) 2 සාමුවෙල් ය. (4) 2 රාජාවලිය ය.

11. ප්‍රඥාව සඳහා භාවිත වන හෙබ්‍රෙව් වචනය,
(1) කොහේන් ය. (2) අදමාහ් ය. (3) හොක්මා ය. (4) එල්ෂඩායි ය.

12. ප්‍රඥා සාහිත්‍යය තුළ දැකිය හැකි සාහිත්‍ය අංගයකි,
(1) රූඞී (2) ඉගිවැකි (3) ප්‍රස්ථා පිරුළු (4) ප්‍රහේලිකා

13. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පසු ක්‍රිස්තුන් වහන්සේව රැගෙන යනු ලැබුවේ,
(1) ආණ්ඩුකාර පිලාත් වෙත ය. (2) හෙරොද් වෙත ය.
(3) ඇන්ටිඕකස් ආණ්ඩුකාරයා වෙත ය. (4) අගෝස්තුස් අධිරාජ්‍යයා වෙත ය.

14. ජේසුස් වහන්සේ වෙනුවෙන් අරමාතියේ ජෝශප් සිදුකළ කාර්යය වූයේ,
(1) ජේසුව භූමදාන කටයුතු කිරීම ය. (2) අන්තිම රාත්‍රී භෝජනය සූදානම් කිරීම ය.
(3) දේව මාළිගයේ දුම් පූජා කිරීම ය. (4) කුරුස ගමනට සහය වීම ය.

15. ''ඔබට ශාන්තිය වේවා !'' යන ජේසුස් වහන්සේ වදාළ ආශිර්වාදය ශ්‍රාවකයන්ට හිමිවූයේ,
(1) ඔවුන් තෝරා ගැනීමේ දී ය. (2) සේවයට පිටත්කර යැවීමේ දී ය.
(3) උත්ථානයෙන් පසු සිදු වූ දර්ශනයේ දී ය. (4) උන්වහන්සේගේ ස්වර්ගාරෝහණයේ දී ය.

16. සදාතන ජීවිතය උරුමකර ගැනීමට නම්,
(1) ලෞකික වස්තුව රැස්කර ධනවතෙක් විය යුතුය.
(2) පීඩාවන්ට පත්ව සිටින්නන් පිළිබඳ තොරතුරු රැස්කළ යුතුය.
(3) ජීවිත ප්‍රශ්න අභියෝග හමුවේ පිළිසරණ පතා යා යුතුය.
(4) පාපී ක්‍රියා අතහැර යාච්ඤාවෙන් හා පරිත්‍යාගයෙන් ජීවත් විය යුතුය.

17. ජුදෙව්වරුන් දෙවියන් වහන්සේට තුති පිදූ මංගල්‍යයකි,
(1) පෙන්තකොස්ත මංගල්‍යය (2) කූඩාරම් මංගල්‍යය
(3) පාස්කු මංගල්‍යය (4) පව්ගෙවීමේ මංගල්‍යය

18. ශුද්ධාත්ම මෙහෙයවීමෙන් පසු සුබ අස්න අදහාගත් විජාතික ශතාධිපතියා වන්නේ,
(1) නිකදේමුස් ය. (2) කොර්නේලියස් ය.
(3) මතියස් ය. (4) සීලස් ය.

19. A- බෙන්ජමින් ගෝත්‍රයට අයත් ගමාලියෙල් යටතේ අධ්‍යාපනය ලැබීය.
B - සභාවේ නායකත්වයට ජේසුස් වහන්සේ විසින් පත්කරන ලදී.
C - උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ අත්දැකීම නිසා ජීවිතය වෙනස් විය.
D- ''මාගේ ස්වාමිනී, මාගේ දෙවියනී'' යනුවෙන් තම විශ්වාසය ප්‍රකාශ කළේය.
ඉහත ප්‍රකාශ අතරින් පාවුලුතුමා හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
(1) A හා B ය. (2) C හා D ය. (3) A හා C ය. (4) B හා D ය.

20. ශුද්ධ වූ පාවුලුතුමා දේව මාළිගයේ දී අත්අඩංගුවට ගනු ලැබුයේ,
(1) පරිසිවරුන් එල්ල කළ චෝදනා මත ය.
(2) දේව මාළිගාවේ සිටි ජුදෙව්වරුන්ගේ චෝදනා මත ය.
(3) ජෙරුසලමෙන් පැමිණි ජුදෙව්වරුන්ගේ චෝදනා මත ය.
(4) ආසියාවෙන් පැමිණි ජුදෙව්වරුන්ගේ චෝදනා මත ය.

21. ''ඔබ ක්‍රිස්තුවරයාණෝය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය.'' මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ,
(1) පේදුරු තුමා ය. (2) ඇන්ඩෲ තුමා ය.
(3) ජාකොබ් තුමා ය. (4) ජොහාන් තුමා ය.

22. කතෝලික සභාවේ 266 වන ශුද්ධෝත්තම පියාණන් වන්නේ,
   (1) පළමුවන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය.
   (2) දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
   (3) දහසය වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.
   (4) දහහතර වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.

23. ශුද්ධ වූ සභාවේ ලක්ෂණ අඩංගු අපගේ විශ්වාසයේ ධර්මතා ඇතුළත් පොදු යැදුමකි,
   (1) ස්වාමිවාක් ආරාධනය.
   (2) ත්‍රිත්ව ස්තෝත්‍රය.
   (3) විශ්වාස ලක්ෂණය.
   (4) නමෝ මරිය යැදුම.

24. ක්‍රි. ව. 1543 දී ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම වනුයේ,
   (1) ජේසු නිකායික ධර්මදූතවරු ය.
   (2) දොමිනිකාන නිකායික ධර්මදූතවරු ය.
   (3) අගෝස්තීන නිකායික ධර්මදූතවරු ය.
   (4) ප්‍රැන්සිස්කාන නිකායික ධර්මදූතවරු ය.

25. ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ශ්‍රී ලාංකේය සභාව වෙත පිදූ උතුම්ම සේවය වන්නේ,
   (1) කිතුනු පාසල් පිහිටුවීමට පුරෝගාමී වීම ය.
   (2) දේශීය කිතුනු සාහිත්‍යයක් ගොඩනැගීම ය.
   (3) රටපුරා කිතුනු ධර්මෝපදේශ මධ්‍යස්ථාන පිහිටුවීමය.
   (4) ගිහි නායකයන් පුහුණුකර පත් කිරීම ය.

26. A - ලංකාව තුළ කැමති ආගමක් ඇදහීමේ නිදහස ලැබීම
   B - නිර්මල මරිය නිකාය මෙරට සේවය සඳහා පැමිණීම.
   C - පාසල් රජයට පවරා ගැනීම.
   D - විදේශීය ධර්මදූතයන්ගේ වීසා අලුත් නොකිරීම.

   ඉහත ප්‍රකාශ අතරින් බ්‍රිතාන්‍ය යුගය තුළ සිදු වූ සිදුවීම් වන්නේ,
   (1) B හා C ය.
   (2) C හා D ය.
   (3) A හා B ය.
   (4) A හා C ය.

27. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු කතෝලික සභාව මුහුණ දුන් ප්‍රධාන ම ගැටලුව වූයේ,
   (1) කතෝලික පියවරුන් රටින් පිටුවහල් කිරීම ය.
   (2) දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් කිරීම ය.
   (3) කැමති ආගමක් ඇදහීමේ නිදහස ලැබීම ය.
   (4) පාසල් රජයට පවරා ගැනීම ය.

28. ක්‍රිස්තුන් වහන්සේ මහබ්‍රහස්පතින්දා දින, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළේ,
   (1) අප හා සදහට ම සිටිනු සඳහා ය.
   (2) මෙළොවින් සමුගැනීමට ය.
   (3) ලෝක අවසානය දැන්වීමට ය.
   (4) නැවත නැවත මතක්කර දීමට ය.

29. මුල් කිතුනුවන් දිව්‍ය පූජාව සඳහා භාවිතා කළ නාමය වනුයේ,
   (1) අන්තිම රාත්‍රී භෝජනය යි.
   (2) පූප කැඩීම යි.
   (3) පරිස්මරණය යි.
   (4) සහභාගීකම යි.

30. ''ජීවනදායක භෝජනය මම ය, මා වෙත පැමිණෙන යමෙක් වේද ඔහුට සාගිනි නොවන්නේ ය.'' මෙලෙස සඳහන් කරන සුභාරංචි කතුවරයා වන්නේ,
   (1) මාක් තුමා ය.
   (2) ජොහාන් තුමා ය.
   (3) ලූක් තුමා ය.
   (4) මතෙව් තුමා ය.

31. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග අතරින් සුවිශේෂ වූයේ,
   (1) නුමුහුන් රොටී ය.
   (2) පාස්කු බැටළුවා ය.
   (3) තිත්ත පලා ය.
   (4) මිදියුෂ ය.

32. දිව්‍ය සත්ප්‍රසාදය යනු,
    (1) වත්පිළිවෙත් අඩංගු ප්‍රසාද නිධානයකි.
    (2) යාගික වත්පිළිවෙත් අඩංගු ප්‍රසාද නිධානයකි.
    (3) පශ්චත්තාපික පිළිවෙතකි.
    (4) ප්‍රේමයේ හා එකමුතුකමේ දේව ප්‍රසාද නිධානයකි.

33. දිව්‍ය පූජාව අර්ථවත් කරගැනීමට නම් අප කළ යුත්තේ,
    (1) අල්තාරය අසළින් ම ඉඳගෙන දිව්‍ය පූජාවට සහභාගීවීම ය.
    (2) බාහිර අලංකාරය මත ජනවන්දනාව සූදානම් කිරීම ය.
    (3) ප්‍රේමය හා සේවය ක්‍රියාවට නංවමින් යාගික දිවියක් ගත කිරීම ය.
    (4) පිරිසිදු ඇඳුමින් සැරසී දිව්‍ය පූජාවට සහභාග වීම ය.

34. පුරාණ ගිවිසුමේ යාග පූජා අතර සත්ත්ව පූජා වැදගත් වූයේ,
    (1) දවන පූජා සඳහා සත්ත්වයින් යොදාගත් බැවිනි.
    (2) ආහාරපානවලට වඩා සත්ත්වයින් මිල අධික වූ බැවිනි.
    (3) රුධිරය තුළ ජීවිතය අන්තර්ගත බැවින් හා ජීවිතය දෙවිඳුන්ට අයිති බැවිනි.
    (4) ආහාර පාන දවන පූජා ලෙස ඔප්පු කළ නොහැකි බැවිනි.

35. දුක් වේදනා හා අභියෝගවලට කිතුනු අප මුහුණ දිය යුත්තේ,
    (1) තම අනාගත ජීවිතයට පණිවිඩයක් වශයෙන් ය.
    (2) තම ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ය.
    (3) දෙවියන් වහන්සේට පිදෙන පඬුරක් වශයෙන් ය.
    (4) දෙවියන් වහන්සේගෙන් ලැබෙන දඬුවමක් වශයෙන් ය.

36. බර්ලින් තාප්පය බිඳ දමා ජර්මනිය එක්සේසත් කළ ශුද්ධෝත්තම පියතුමා වන්නේ,
    (1) දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
    (2) පළමුවන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය.
    (3) හයවන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
    (4) දහසය වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.

37. තෙරේසා මව්තුමිය සමාජ සත්කාරයක් ලෙස නිව්යෝර්ක් නගරයේ විශේෂිත නිවසක් ඉදිකළේ,
    (1) වීදි දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ය.
    (2) ඒඩ්ස් රෝගීන් සඳහා ය.
    (3) දුගී අසරණ අනාථයන් සඳහා ය.
    (4) මුඩුක්කු හා පැල්පත්වාසීන් සඳහා ය.

38. දෙව් මව්න්ගේ ආදරය ලොව පුරා පැතිර වීමට ගරු කෝල්බේ පියතුමා ක්‍රියා කළේ,
    (1) සත්‍ය නමැති ලිපිය පළකිරීමෙන් ය.
    (2) ෆ්‍රැන්සිස් නමැත්තා වෙනුවෙන් ජීවිතය පූජා කිරීමෙන් ය.
    (3) මරිය තුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව බිහිකිරීමෙන් ය.
    (4) සිරගතව දරුණු වදහිංසා විඳීමෙන් ය.

39. ගරු මයිකල් රුද්‍රිගු පියතුමාගේ ජීවිතය තුළ කැපී පෙනුණු සේවාවකි,
    (1) අනාථ අසරණ වීදි දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදීම.
    (2) සිරගත වූවන් වෙනුවෙන් මැදහත් වීම.
    (3) ප්‍රදේශයේ දේශපාලන කටයුතුවලට මුල්තැන දීම.
    (4) යාචකයින් පුනරුත්ථාපනය කර ශ්‍රමාභිමානී පිරිසක් කිරීම.

40. ශුද්ධ වූ සභාවේ වත්මන් දෘෂ්‍යමාන නායකයාණන්ගේ පැවිදි නිකාය වන්නේ,
    (1) ජේසු නිකාය ය.
    (2) ෆ්‍රැන්සිස්කන් නිකාය ය.
    (3) දොමිනිකන් නිකාය ය.
    (4) අගුස්තීනු නිකාය ය.

(ලකුණු 1 × 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය II** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. (1) ශුද්ධ බයිබලය ලේඛනගත වූ කාලය ලියන්න.

(2) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ කතුවරයා සහ පොත පිළිගන්වන ලද තැනැත්තා ලියා දක්වන්න.

(3) පාවුළුතුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න.

(4) උත්ථාන වූ ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වූ අවස්ථා දෙකක් ලියන්න.

(5) පළමු ධර්මදූත ගමනේ දී පාවුළුතුමා සිදුකළ කාර්යයන් දෙකක් ලියන්න.

(6) ජේසුස් වහන්සේ අනුගාමී වූ ජෝනාගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

(7) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් රචිත කෘති දෙකක් ලියන්න.

(8) පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යය වාර්තා කරන සුභාරංචි කතුවරු දෙදෙනෙක් නම් කරන්න.

(9) ඊශ්‍රායෙලයේ ප්‍රධාන පූජා කොටස් දෙක නම් කරන්න.

(10) තෙරේසා මව්තුමිය ඇතුළත් වූ සහ ආරම්භ කළ පැවිදි නිකායයන් නම් කරන්න.

(ල. 2 x 10 = 20)

02. (1) ලූක් තුමා පිළිබඳ කරුණු දෙකක් ලියන්න.

(2) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ සැකැස්ම තුළ ඇතුළත් කරුණු තුනක් ලියන්න.

(3) සුභාරංචිය අන් අය වෙත ගෙන යාමට පාසල් සමාජය තුළ ඔබට කළ හැකි දේවල් පහක් ලියා විස්තර කර දක්වන්න.

(ල. 2 + 3 + 5 = 10)

03. (1) එළිදරව්වාදී ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(2) එළිදරව් සාහිත්‍ය තුළ සුදු, රතු, කළු යන වර්ණවලින් සංකේතවත් කරන අර්ථ ලියන්න.

(3) වර්තමාන සමාජ අභියෝග හමුවේ දේව විශ්වාසය පෝෂණය හා සංවර්ධනය කරගැනීමට ඔබට කළහැකි ක්‍රියා පහක් විස්තර කර දක්වන්න.

(ල. 2 + 3 + 5 = 10)

04. (1) ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ සිදු වූ පාරිසරික වෙනස්කම් දෙකක් ලියන්න.

(2) කුරුසයේ එල්ලී සිටිය දී ජේසුස් වහන්සේ ට කළ අපහාස ක්‍රියා තුනක් ලියන්න.

(3) ස්වර්ගීය ජීවිතය දිනා ගැනීමට සුදුස්සෙකු වීම සඳහා ඔබට කළ හැකි ක්‍රියා පහක් විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

05. (1) ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරු දෙදෙනා නම් කරන්න.

(2) උපස්ථායකයන් සතු විය යුතු ගුණාංග තුනක් ලියන්න.

(3) මුල් කිතුණු සභාවේ ලක්ෂණ මීසම් සංසය තුළ ක්‍රියාත්මක කිරීමට ඔබ කරන යෝජනා පහක් විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

06. (1) දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳව පූර්ව සලකුණු දෙකක් ලියන්න.

(2) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් තුනක් ලියන්න.

(3) ප්‍රේමයේ භෝජනයෙන් පෝෂණය වූ ඔබ ප්‍රේමයේ පණත ක්‍රියාවට නංවන ආකාරය කරුණු පහක් තුළින් විස්තර කර දක්වන්න.

(ල. 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) මුල් කිතුනු සභාව

(2) ශුද්ධ වු සභාව

(3) ශුද්ධ වු ජුසේවාස් පියතුමා

(4) ශුද්ධ වු මැක්සිමිලියම් කෝල්බේ මුනිතුමා

(ල. 5 + 5 = 10)

**පිළිතුරු පත්‍රය - I පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(4) | 4 -(1) | 5 -(4) | 6 -(1) | 7 -(2) | 8 -(1) | 9 -(3) | 10 -(2) |
| 11-(3) | 12-(4) | 13-(1) | 14-(1) | 15-(3) | 16-(4) | 17-(1) | 18-(2) | 19-(3) | 20-(4) |
| 21-(1) | 22-(1) | 23-(3) | 24-(4) | 25-(2) | 26-(3) | 27-(4) | 28-(1) | 29-(2) | 30-(2) |
| 31-(2) | 32-(4) | 33-(3) | 34-(3) | 35-(3) | 36-(1) | 37-(2) | 38-(3) | 39-(4) | 40-(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II පත්‍රය**

01. (1) ක්‍රි. පූ. 950 - ක්‍රි. ව. 100 අතර (2) කතුවරයා - ශු. ලූක් තුමා
පිළිගන්වා ඇත්තේ තියෝපිලස් තුමාට
(3) කාර්ය බහුලත්වය නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ අපහසුව නිසා සිරගතව සිටීම නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ නොහැකියාව.
(4) පාස්කු ඉරුදින එම්මාවුස් බලා ගිය ගෝලයින් දෙදෙනාට, පාස්කු ඉරුදින සවස අපෝස්තුලුවරුන් වෙත වැඩ කිරීමේ දී දින අටකට පසු තෝමස් තුමාට දර්ශනය වීම.
(5) දේශනා කිරීම, කිතුනු සංඝ ස්ථාපිත කිරීම, නායකයන් පත් කිරීම.
(6) සීමෝන් පේදුරුතුමා, ඇන්ඩෘතුමා
(7) දේවවේද පුරාණය, වේද කාව්‍ය, පසන් පොත, මංගල ගීතය
(8) මතෙව්තුමා, මාක්තුමා, ලූක්තුමා, ජොහාන්තුමා
(9) දවන පූජා නොදවන පූජා
(10) ඇතුළත් වූයේ - ලොරෙට්ටෝ නිකාය / ආරම්භ කළේ - දයාවේ දූතිකාවෝ

02. (1) ඉතිහාසඥයෙකි, චිත්‍ර ශිල්පියෙකි, වෛද්‍යවරයෙකි, පාවුලුතුමාගේ දෙවන හා තෙවන චාරිකාවලට සම්බන්ධ වී ඇත.
(2) ධර්මදූත සේවයට සූදානම (ක්‍රියා 1) / ජෙරුසලමෙහි සාක්ෂි දැරීම (ක්‍රියා 2 - 7) / ජුදයෙ හා සමාරියේ සාක්ෂි දැරීම (ක්‍රියා 8 - 12) / ශුද්ධ වූ පාවුලුතුමාගේ ධර්මදූත සේවය (ක්‍රියා 13 - 28)
(3) ආදර්ශමත් ජීවිතයක් ගත කිරීම, වගකීම් නිසි ලෙස ඉටු කිරීම, කිතු සමිඳුන් ගැන අන් අයට කියා දීම, පාසලේ විවිධ ස්ථාන වල දේව වචනය ප්‍රදර්ශනය කිරීම, උදෑසන පාසල් යැදුමට දේව වචනය එක්කර ගැනීම........ ආදී පිළිතුරු සලකා බලා ලකුණු ලබාදෙන්න.

03. (1) දානියෙල්, එළිදරව්ව
(2) සුදු - ජයග්‍රහණය / රතු - යුද්ධය ලේ වැගිරීම් / කළු - සාගතය
(3) යාච්ඤා කිරීම, ශුද්ධ ලියවිලි, පාඨ කියවීම, ශුද්ධ බයිබලීය චරිත ආදර්ශයට ගැනීම, භාවනා වැඩසටහන් හා ධර්ම විවේක සංවිධානය හා සහභාගීවීම, දේව වචනය නිවැරදිව ඉගෙන ගැනීම හා අන් අයට කියාදීම, සමාජය ඉදිරියේ නොබියව විශ්වාසය ප්‍රකාශ කිරීම, දේව පනත් ආරක්ෂා කරමින් දැහැමි ජීවිතයක් ගත කිරීම ....... යනා දී පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

04. (1) හිරු අඳුරු වීම, රටපුරා අන්ධකාරය පහළ වීම.
(2) ඔවුන් වහන්සේට සරදම් කිරීම, කාඩි පිළිගැන්වීම, වස්ත්‍ර බෙදා ගැනීමට දාදු දැමීම, ජේසු නසරේනු ජුදයන්ගේ රජ (INRI) යනුවෙන් දක්වමින් ලියූ පුවරුව කුරුසියට ඉහළින් තැබීම.
(3) සත්‍යයට සාක්ෂි දැරීම හා සත්‍යවාදී වීම, කිතුනු යුතුකම් හා වගකීම් නිසියාකාරව ඉටු කිරීම, දේව වචනය තුළ ආදර්ශමත් ජීවිතයක් ගත කිරීම, ආත්මික හා ශාරීරික පුණ්‍ය ක්‍රියාවල යෙදීම, ප්‍රසාද නිධාන ලබා ගැනීම, දස පනතට අනුව දැහැමි දිවියක් ගත කිරීම...... යනාදී පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

05. (1) ශුද්ධ වූ ස්තේපන්තුමා, ශුද්ධ වූ මහා ජාකෝබ්තුමා (සන්තියාගෝ මුනිතුමා)
(2) යහපත් දිවි පෙවෙතක් ගත කිරීම. / ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම. / ප්‍රඥාවෙන් පූර්ණ වීම.
(3) දේව විශ්වාසය පළුදු වූ අය ද සාන්ත සභාවෙන් බැහැර ගිය අය ද නැවත කැඳවා ගැනීම, රෝගීන් හා අසරණ වූවන් බැහැදැක ගෙයින් ගෙට ගොස් යාච්ඤා කිරීම, දේව වචනය ජනතාව අතරට ගෙන යන වැඩසටහන් සංවිධානය කිරීම, තරුණ තරුණියන් වැඩි වශයෙන් මීසමේ සේවාවන්ට දායක කර ගැනීම, දේව කැඳවීම් වෙනුවෙන් විශේෂයෙන් යාච්ඤා කිරීම හා ඒ සඳහා තරුණ තරුණියන් දිරි ගැන්වීම, මීසමේ දුගී අයට උපකාරී කිරීම, දිව්‍ය පූජාවේ වටිනාකම ජනතාවට අවබෝධ කර දී දිව්‍ය පූජාවට මීසමේ සියලු ම දෙනා සහභාගී කරවා ගැනීම...... යනාදී පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

06. (1) මෙල්කිසදෙක්ගේ යාගය, මන්නා භෝජනය, නුමුහුන් පූප අනුභවය හා කුසලානෙන් පානය කිරීම, පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්ය
(2) පූප කැඩීම, ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය, නව පාස්කු මංගල්‍යය, ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගීකම
(3) රෝගී හා මහළුව සිටින අයට සංවේදී වී ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර දීම, මිනිස් අයිතිවාසිකම් සුරැකීම, සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන් කටයුතු කිරීම, දේව වචනය අන් අය අතරට ගෙන යාම, දෙවිඳුන් වෙනුවෙන් සේවයට කැපවීම, අත්‍යවශ්‍ය දේ පවා අන්අය සමග බෙදා ගැනීම, විරුද්ධවාදීන් ට සමාව දීම, වගකීම් හා යුතුකම් ඉටු කිරීම, දේව විශ්වාසය වර්ධනය කර ගැනීම...... යනාදී පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

07. (1) පිටු අංක 24, 25 (2) පිටු අංක 34 - 36 (3) පිටු අංක 40- 41
(4) පිටු අංක 60 - 61